ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනපති උපාධි වැඩසටහන 2023/2024

අවසාන පරීක්ෂණය - 2024

**SNPA609 - විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ ගුණාත්මක පර්යේෂණ ක්‍රම**

කාලය - පැය තුන (03) යි.

---

දිනය : 2025.05.17 වේලාව : ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

ප්‍රශ්න අංක 01 සහ වෙනත් ඕනෑම ප්‍රශ්න තුනකට (03) පිළිතුරු සපයන්න.

01. විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනඥයෙකු ලෙස, පහත සඳහන් අංශ වලින් එකක් තෝරා ගැනීමෙන් ගුණාත්මක පර්යේෂණ සිදු කරන ලෙස ඔබේ ආයතනික ප්‍රධානියා ඔබෙන් ඉල්ලා සිටී.

(අ.) විශේෂ අධ්‍යාපන ඒකක

(ආ.) අන්තර්කරණ අධ්‍යාපනය

(ඇ.) පුද්ගල බද්ධ අධ්‍යාපන වැඩසටහන්

(ඈ.) සහායක තාක්ෂණය ක්‍රියාත්මක කිරීම

(i.) ඉහත සඳහන් කළ අංශවලින් එක් අංශයකට අදාළ පර්යේෂණ ගැටළුවක් හඳුනා ගන්න. (ලකුණු 05)

(ii.) තෝරාගත් පර්යේෂණ ගැටලුවේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii.) තෝරාගත් ගැටලුවට අදාළව අධ්‍යයනයේ අරමුණු සඳහන්කර පර්යේෂණ අරමුණු/ ප්‍රශ්න හතරක් **(04)** සකස් කරන්න. (ලකුණු 08)

(iv.) ඔබේ පර්යේෂණ ගැටලුව සඳහා සුදුසු ගුණාත්මක පිරිසැලසුමක් තෝරාගෙන හේතු තුනක් **(03)** සමඟ ඔබේ තේරීම සාධාරණීයකරණය කරන්න. (ලකුණු 04)

(v.) අධ්‍යයනයේ සහභාගීවන්නන් සඳහන්කර ඔබේ තේරීම සාධාරණීය කරමින් සහභාගී වන්නන් තෝරා ගැනීමේ ක්‍රියාවලිය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(vi.) ඔබේ අධ්‍යානය සඳහා දත්ත එකතු කරන ක්‍රියාවලිය සවිස්තරාත්මකව විස්තර කරන්න. (ලකුණු 06)

(vii.) ඔබේ අධ්‍යානය සඳහා ගුණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රියාවලිය සාකච්ඡා කරන්න. (ලකුණු 06)

(viii.) ඔබේ අධ්‍යානයේ සොයාගැනීම් බෙදාහැරීම සඳහා ඔබේ සැලැස්ම ගෙනහැර දක්වන්න. (ලකුණු 02)

(එකතුව=ලකුණු 40)

02. (i.) "ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශය" යන සංකල්පය පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii.) ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශයෙහි සුවිශේෂී ලක්ෂණ ඉදිරිපත් කරන්න. (ලකුණු 07)

(iii.) විශේෂ අවශ්‍යතා අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශයේ වැදගත්කම උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(එකතුව=ලකුණු 20)

03. ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශය තුළ ජනප්‍රිය සහ විශේෂ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ යොදාගත හැකි පර්යේෂණ පිරිසැලසුම් දෙකක් **(02)** තෝරා ගෙන පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(i.) පර්යේෂණ පිරිසැලසුම් දෙක **(02)** සඳහන් කර ඔබ මෙම පර්යේෂණ පිරිසැලසුම් තෝරාගැනීමට හේතු සාධාරණීකරණය කරන්න. (ලකුණු 06)

(ii.) තෝරාගත් එක් එක් පර්යේෂණ පිරිසැලසුම් වල සුවිශේෂී ගුණාංග තුන **(03)** බැගින් පැහැදිලි කරන්න. (ලකුණු 07)

(iii.) තෝරාගත් එක් එක් පර්යේෂණ පිරිසැලසුම් වල ශක්තීන් තුන **(03)** බැගින් සහ සීමාවන් තුන **(03)** බැගින් සාකච්ඡා කරන්න. (ලකුණු 07)

(එකතුව=ලකුණු 20)

04. (i.) ගුණාත්මක පර්යේෂණ වලදී සම්භාවිතා නොවන නියැදියේ විවිධ ක්‍රම මොනවාද? (ලකුණු 06)

(ii.) ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශයන් තුළදී බහුලව යොදා ගන්නා නියැදි කරන ක්‍රම දෙකක් **(02)** උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 07)

(iii.) එක් එක් නියැදි කරන ක්‍රමවේද තුළ ඇති ශක්තීන් හතරක් **(04)** සහ සීමාවන් හතරක් **(04)** ඉදිරිපත් කරන්න. (ලකුණු 07)

(එකතුව=ලකුණු 20)

05. දත්ත යනු පර්යේෂණයන්හි ප්‍රධාන සාධකයකි. මේ අනුව දත්ත රැස් කිරීම සහ දත්ත විශ්ලේෂණය පර්යේෂණයන්හි තීරණාත්මක කොටස් වේ.

(i.) ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශයේ බොහෝ විට භාවිතා කරන දත්ත රැස් කිරීමේ ක්‍රම දෙකක් **(02)** පැහැදිලි කර ඒවා සිදු කළ යුතු ආකාරය විස්තර කරන්න. (ලකුණු 06)

(ii.) ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශයේ දත්ත එකතු කරන්නාගේ අද්විතීය ලක්ෂණ, උදාහරණ උපුටා දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii.) විශේෂ අවශ්‍යතා අධ්‍යාපන ක්ෂේත්‍රයේ පර්යේෂණවල ආචාර ධර්මවල වැදගත්කම සහ ගුණාත්මක දත්තවල විශ්වාසනීයත්වය පවත්වා ගන්නේ කෙසේද යන්න උදාහරණ උපුටා දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(එකතුව=ලකුණු 20)

- සියළුම හිමිකම් ඇවිරිණි. -